රත්නපුර ප්‍රාදේශීය සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රත්නපුර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමේදී ගෙවා තිබුණු එකතුකල අගය මත බදු රු.180,300 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව.	එකතු කළ අගය මත බදු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් රු.61,550 ක් වටිනා පරිගණක උපාංග ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව.	පරිගණක උපාංග වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු.82,344 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව.	ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වියයුතු ස්ථාවර තැන්පත් පොළී ආදායම් රු.1,812,604 ක් හා ස්ථාවර වත්කම් වෙන්දේසියෙන් ලද ආදායම් රු.72,885 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.	2025 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව.	ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ගිණුම් විෂයයන් 06 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.4,938,289 ක වෙනසක් පැවතුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති රෙගුලාසි ආදියට යොමුව	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(5)	2014, 2022 හා 2023 වර්ෂවලදී ලබා දී තිබුණු රු.240,000 ක අත්තිකාරම් 03 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ද පියවා නොතිබුණි.	හිටපු සභාපතිවරුන් දෙදෙනෙකු විසින් ලබාගෙන ඇති මෙම අත්තිකාරම් පියවන ලෙස දැනුවත් කර ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,608,393 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,664,917 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	1,903,550	1,384,500	1,407,902	47,043	2,940,630	985,330	975,838	75,000
කුලී	1,000,000	464,760	464,760	-	2,500,000	50,452	50,452	-
බලපත්‍ර ගාස්තු	1,385,000	1,397,485	1,397,485	-	2,240,200	1,176,830	1,176,830	-
වෙනත් ආදායම්	3,497,000	3,818,848	4,076,930	-	3,933,000	2,640,941	1,512,340	-
	7,785,550	7,065,593	7,347,077	47,043	11,613,830	4,853,553	3,715,460	75,000

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දියුණු ගම් ප්‍රදේශවලින් වරිපනම් බදු අයකිරීමට අදාළ ක්‍රියාවලිය ආරම්භ කර වසර 05 කට වඩා වැඩි කාලයක් ගතව තිබුණද, 2025 අප්‍රේල් වන විටත් දේපල තක්සේරු කර වරිපනම් අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබුණි.	දේපල තක්සේරු කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කරන බව.	වරිපනම් බදු අයකිරීමට අදාළ කටයුතු කාර්යක්ෂම කළ යුතුය.
(ආ)	සභාව සතු අනුමත ත්‍රීරෝද රථ ගාල් 13 ක් පැවතියද, ඉන් ත්‍රීරෝද රථගාල් 04 කට අයත් ත්‍රීරෝද රථ 43 කින් පමණක් රු.43,000 ක සාමාජික ගාස්තු අයකර ගෙන තිබුණි. ඉතිරි රථගාල් 09 හි පවතින ත්‍රීරෝද රථ සංඛ්‍යාව හඳුනාගෙන ගාස්තු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	බොහෝ ත්‍රීරෝද රථ හිමියන් අදාළ ස්ථානවල නොසිට පෞද්ගලිකව තම සේවාව සිදු කිරීමත් ත්‍රීරෝද රථ සංගම් සාමාජිකයින් සෑම වර්ෂයකදීම අඩු වීම සහ වැඩි වීම වශයෙන් සිදු වීමත් නිසා ඔවුන්ගේ සංගම් සාමාජිකත්වය සම්බන්ධයෙන් නිශ්චිතව කිව නොහැකි බව.	සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
“ඉ-මහජන පුස්තකාල” වැඩසටහනෙහි සමාරම්භක උත්සවය සඳහා 2022 මාර්තු 08 දින රු.72,415 ක් වැය කර තිබුණ ද, ඉන් ඉදිරියට සැලසුම්ගත පරිදි වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	සැලසුම්ගත පරිදි වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහජන පුස්තකාලය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 04 වගන්තිය ප්‍රකාරව, මහජන පුස්තකාලයේ අධීක්ෂණය හා සාමාන්‍ය පරිපාලනය සඳහා වාර්ෂිකව පත් කළයුතු උපදේශන කමිටුව 2025 අප්‍රේල් වන විටත් පත්කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ගල්ලෑල්ල උප කාර්යාලය පිහිටි ඉඩමේ අක්කරයක පමණ පැරණි තේ වගාව ඉවත් කර නව තේ වගාවක් කිරීම සඳහා රු.1,286,205 ක් වැයකර තිබුණි. එහෙත්, එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ඒ සඳහා අවශ්‍ය විශේෂඥ උපදෙස් ලබාගෙන භූමිය සකස් කර පැල සිටුවීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2024 ජූලි 31 දින වන විට වටිනාකම රු.124,000 ක තේ පැල මැරී ගොස් තිබුණි.	මේ වන විට කුඩා තේ වතු අධිකාරියෙන් උපදෙස් ලබාගෙන ගල්ලෑල්ල උප කාර්යාලය භාර කාර්යය භාර නිලධාරිගේ අධික්ෂණය යටතේ සියළු කටයුතු සිදු කරන බව.	ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය.
(ඇ)	ග්‍රේටර් රත්නපුර ජල සැපයුම් ව්‍යාපෘතිය මඟින් ප්‍රාදේශීය සභා මාර්ගයන් පළුදු කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.2,950,000 ක් තැන්පත් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය අවසන් කර මාර්ගයන් නැවත සකසා තැන්පතු මුදල් නිදහස් කරන ලෙස 2022 වර්ෂයේදී ඉල්ලීම් කර තිබුණද, 2025 අප්‍රේල් වන විටත් අදාළ මාර්ගයන් පරීක්ෂා කර බලා තැන්පතුව නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.	ග්‍රේටර් රත්නපුර ජල සැපයුම් ව්‍යාපෘතියේ තැන්පතු මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව.	අදාළ මාර්ගයන් පරීක්ෂා කර බලා තැන්පතුව නිදහස් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	මූල්‍ය ප්‍රකාශන තුළ 1998 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන රු.25,000 ක හර ශේෂයක් හා රු.400,278 ක බැර ශේෂ 06 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.	2025 වර්ෂය තුළ නිරවුල් කිරීමට කටයුතු කරන බව.	අදාළ ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබා නොගත් ගොඩනැගිලි සැලසුම් 09 ක් සඳහා සභා අනුමැතිය ලබා දී තිබුණි.	2023 වර්ෂය දක්වා පිඹුරුපත සඳහා භූමි යෝග්‍යතා සහතිකය ලබාගෙන ගොඩනැගිලි සැලසුම් සඳහා අනුමැතිය ලබා දී ඇති බව හා ඉදිරියේදී ගොඩනැගිලි සැලසුම සඳහා ද ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව.	ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබා ගෙන ගොඩනැගිලි සැලසුම් සඳහා අනුමැතිය ලබා දිය යුතුය.
(ආ)	2021 වර්ෂයේදී සංවර්ධන බලපත්‍රයක් ලබා දී තිබුණු ඉඩමක් සඳහා 2025 අප්‍රේල් වන විටත් අනුකූලතා සහතිකය ලබාගෙන නොතිබුණු නමුත් අදාළ ඉඩම කට්ටි කර විකිණීමට ද කටයුතු කර තිබුණි.	සංවර්ධනය කළ පසු අදාළ ඉඩම සඳහා අනුකූලතා සහතිකයක් ලබා දිමට කටයුතු කරන බව.	ඉඩමේ සංවර්ධන කටයුතු අවසන් කළපසු , අනුකූලතා සහතිකය ලබාදීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කැබලි කර විකිණීම සඳහා අනු බෙදුම් සැලසුමක් අනුමත කරවා ගැනීමට ඉදිරිපත් කර තිබුණු ඉඩමක එක් ඉඩම් කට්ටියක් පමණක් නේවාසික පදිංචියට සුදුසු බවත්, අනෙක් ඉඩම් කොටස් 10 වගා කටයුතු සඳහා සුදුසු බවත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිර්දේශ කර තිබුණි. එහෙත්, ඊට පටහැනිව නේවාසික පදිංචිය සඳහා සම්පූර්ණ භූමිය සංවර්ධනය කිරීමට සභා අනුමැතිය ලබා දී තිබුණු අතර සංවර්ධන අවසරය ලබා දීමේදී අයකළ යුතු පෙරසැරි ගාස්තුව ද අයකර නොතිබුණි.	සංවර්ධනය සඳහා පමණක් අවසර ලබා දී ඇති අතර ඉඩම් කට්ටි වෙන්දේසි කිරිමට පෙර පෙරසැරි ගාස්තු අය කිරිමට කටයුතු කරන බව හා විගණනයෙන් පෙන්වා දුන් පසු මෙම ඉඩමේ බිම් කට්ටි 03 ක් පමණක් සංවර්ධනය කරන ලෙස ලිපි නිකුත් කර ඇති බව.	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතු අතර පෙරසැරි ගාස්තුව අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය.

(ඇ)	අනවසර ඉදිකිරීම් සිදුකර පසුව නියමානුකූල කර ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා සැලසුම් කමිටුවට යොමුකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 10 ක් සඳහා නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ 14 වගන්තිය අනුව අය කළ යුතු දඩ අය කිරීමකින් තොරව ආවරණ අනුමැතිය ලබා දී තිබුණි.	ගොඩනැගිලි සැලසුම අනුමත කිරිමේ දී එම ක්‍රමවේදයට පුද්ගලයා අනුගත කිරීම මූලික අරමුණ ලෙස සලකා කටයුතු කොට ඇති බව හා අනුමැතියට යොමු කර ඇති අතුරු ව්‍යවස්ථාවට අනුව වසර 03 ක සහන කාලයක් අනවසර ඉදිකිරීම් නියාමනය කිරීම සඳහා සලකා බලන මෙන් දක්වා ඇති බව.	නිවාස හා නගර සංවර්ධන ආඥා පනත අනුව අයකළ යුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 **වාහන පද්ධතිය කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)(i)	2023 වර්ෂයේදී අනතුරට පත්ව තිබුණු කම්පැක්ටර් රථය අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන බව යාන්ත්‍රික ඉංජිනේරු විසින් දන්වා තිබුණි. එහි රියදුරුගේ බලපත්‍රය කල් ඉකුත් වී තිබීම නිසා රක්ෂණ වන්දි ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණ ද, පසුව සභාවේ ඉල්ලීම මත රු.1,500,000 ක් පමණක් ප්‍රතිපූරණය කිරීමට රක්ෂණ ආයතනය එකඟ වී තිබුණි. රථය අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ නොපවතින බැවින් සම්පූර්ණ රක්ෂණ මුදල වන රු.4,300,000 ක් ලබාදෙන ලෙස සභාව ඉල්ලීම් කර තිබුණ ද, 2025 මැයි වන විටත් ඒ සඳහා රක්ෂණ ආයතනයේ එකඟතාවය ලැබී නොතිබුණි. මෙම රථය බාහිර ස්ථානයක ගාල් තිබුණු අතර එහි යතුර හා අමතර යතුර ද රියදුරු භාරයේ පැවතිණි. කසළ ගාස්තු එකතු කිරීම ද මෙම රියදුරු විසින් ම සිදුකර තිබුණු අතර අනතුර සමඟ රු.213,000 ක් වූ ලදුපත් 71 ක් සහිත කුවිතාන්සි පොත් 02 ක් ද අස්ථානගත වී තිබුණි.	රක්ෂණ වන්දි ලෙස රු.1,500,000 ක් ලබාදීම සඳහා රක්ෂණ ආයතනය එකඟ වී ඇත. මේ වන විට රාජකාරි කටයුතුවලින් පසු සියළුම වාහන ආයතන පරිශ්‍රයේ ගාල් කරනු ලබන අතර යතුරු කාර්යාලයේ තබන බව හා වාහනවල අමතර යතුරු සේප්පුවේ තබා ඇති බව. කුවිතාන්සි පොත් අස්ථානගත වීම සම්බන්ධව මු.රෙ.104(4) පරීක්ෂණ සිදු කරන අතර, එහි නිර්දේශ ලැබුණු පසු ඒ අනුව කටයුතු කරන බව.	අනතුර හා කුවිතාන්සි පොත් අස්ථානගත වීම සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකීම් නිශ්චය කළ යුතුය.

(ii)	ඉහත (අ)(I) හි සඳහන් ගාබේජ් කම්පැක්ටර් රථය සඳහා කිලෝමීටර් 35,000 ක වගකීමක් සහිත ටයර් 06 ක් සවිකර තිබිය දී කිලෝමීටර් 16,830 ක් ධාවනය කිරීමෙන් පසු ඒවා ඉවත් කර නැවත අලුත් ටයර් සවිකර තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	පරීක්ෂණ පවත්වා වගකීම් නිශ්චය කළ යුතුය.

3.5 දෘශ්‍ය අක්‍රමිකතා

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)(i)	ප්‍රාදේශීය සභාවේ වාහන සඳහා ඉන්ධන සැපයීමේ සිට ගෙවීම් වවුචරය සකස් කිරීම දක්වා වන සියළු කාර්යයන් එක් නිලධාරිනියක වෙත පවරා තිබීමෙන් ඒ සම්බන්ධ අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක පැවැතිණි. එම නිලධාරිණිය විසින් ඉන්ධන බිල්පත් පියවීමේදී කූට ලේඛන සකස් කර 2023 මැයි සිට 2024 ජනවාරි 19 දක්වා කාලපරිච්ඡේදය තුළ රු.2,227,400 ක පමණ මූල්‍ය අක්‍රමිකතාවක් සිදුකර ඇති බව මූලික විමර්ශනක් මඟින් අනාවරණය කර තිබුණි. ඊට අදාළ ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී, එම වවුචර්වලට අමුණා තිබුණු ඉන්ධන ඇණවුම් පිටපත් සියල්ල විකෘති කර වෙනස් කර ඇති බව නිරීක්ෂණය විය. එසේ තිබියදීත්, එම වවුචර් පරීක්ෂා කරන, නිර්දේශ කරන, අනුමත කරන හා ගෙවීම් සහතික කරන නිලධාරීන් ඒ පිළිබඳ නොසලකා හැර කටයුතු කර තිබුණි.	මේ සම්බන්ධයෙන් රත්නපුර පොලීසියෙන් විසින් රත්නපුර ම/උ 87559 දරන අංකය යටතේ 2024 මාර්තු 01 දින අධිකරණයට කරුණු වාර්තා කර ඇති බව හා ඒ සම්බන්ධව විමර්ශනය කර ප්‍රගතිය වාර්තා කිරීම සඳහා ගරු අධිකරණය මඟින් නියෝග නිකුත් කර ඇති ඇති බව. එසේම නිලධාරිනියට චෝදනා පත්‍රයක්ද නිකුත් කර ඇති බව.	වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු අතර නෛතික ක්‍රියාමාර්ග වල ප්‍රගතිය පසුවිපරම් කළ යුතුය.

(ii)	ඉහත අක්‍රමිකතාවයට අදාළ මූලික විමර්ශනය අවසන් කර එහි වාර්තාව ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2024 ජූලි 15 දින භාර දී තිබුණ ද, අදාළ නිලධාරීන් වෙත චෝදනා පත්‍ර නිකුත් කිරීම 2025 අප්‍රේල් දක්වා ප්‍රමාද වී තිබුණි. එමෙන්ම, මෙම සිදුවීම සම්බන්ධයෙන් 2024 පෙබරවාරි 15 දින රත්නපුර පොලිසියේ පැමිණිල්ලක් සටහන් කර තිබුණ ද, 2025 මැයි වන විටත් අදාළ නිලධාරීන්ට එරෙහිව අධිකරණයෙහි නඩු පවරා නොතිබුණු අතර, එම විමර්ශනවල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතිණි.	මේ සම්බන්ධයෙන් රත්නපුර පොලීසියෙන් විසින් රත්නපුර ම/උ 87559 දරන අංකය යටතේ 2024 මාර්තු 01 දින අධිකරණයට කරුණු වාර්තා කර ඇති බව හා ඒ සම්බන්ධව විමර්ශනය කර ප්‍රගතිය වාර්තා කිරීම සඳහා ගරු අධිකරණය මඟින් නියෝග නිකුත් කර ඇති ඇති බව. එසේම නිලධාරිනියට චෝදනා පත්‍රයක්ද නිකුත් කර ඇති බව.	වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු අතර නෛතික ක්‍රියාමාර්ග වල ප්‍රගතිය පසුවිපරම් කළ යුතුය.
(ආ)	ජී.අයි.එස්. තාක්ෂණයෙන් මාර්ග සිතියම්ගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ රාජකාරිය ද, 2022 ඔක්තෝබර් 26 සිට 2024 ජනවාරි 26 දක්වා කාලය තුළ ඉහත (අ)හි සඳහන් නිලධාරිනිය වෙත පවරා තිබුණු අතර, ඒ සඳහා Lap top පරිගණක යන්ත්‍රයක් ද ලබා දී තිබුණි. මෙම නිලධාරිනිය විසින් එම Lap top පරිගණක යන්ත්‍රයේ පැවති වර්ෂ 01 මාස 03 ක පමණ කාලසීමාවකට අදාළ දත්ත මකා දමා තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකර තිබුණු පරීක්ෂණයේ නිර්දේශ ප්‍රකාරව එම කාර්යය සඳහා වැයකර තිබුණු මුදල් හා සියයට 25 ක ගාස්තුව ඇතුළත්ව රු.306,067 ක් දින 14 ක් ඇතුළත ගෙවන ලෙස 2025 පෙබරවාරි 24 දින එම නිලධාරිනියට දන්වා තිබුණද, 2025 අප්‍රේල් වන විටත් එකී මුදල් අයවී නොතිබුණි. එමෙන්ම ඇය විසින් ලබාගෙන තිබුණු ආපදා ණය මුදලින් රු.245,833 ක් අයවිය යුතු පැවතුණු අතර, 2023 වර්ෂයේදී අවස්ථා 02 කදී ලබා දී තිබුණු රු.16,790 ක අත්තිකාරම් ද පියවා නොතිබුණි.	මේ සම්බන්ධ මු.රෙ. 104(4) හානි පාඩු පරීක්ෂණයක් සිදු කර ඇති අතර ඒ අනුව රු.306,067 ක මුදලක් ගෙවන ලෙස නිලධාරිනියට දන්වා ඇති බව.	හානි පාඩු පරීක්ෂණයේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.